ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
SURVEY DEPARTMENT OF SRI LANKA

මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව
அளவையியல் படமாக்கல் நிறுவனம் - தியத்தலாவை
INSTITUTE OF SURVEYING & MAPPING - DIYATALAWA

ඔබේ අංකය / உமது இல. / Your No. }    මගේ අංකය / எனது இல. / My No. } අයි/ගි/07/2026/QC/16    දිනය / திகதி / Date } 2026.06.17

කළමනාකරු,

..........................................................

..........................................................

**දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතන පරිශ්‍රයේ නඩත්තු සේවාව (තණකොළ කැපීම) සඳහා මිල ගණන් කැඳවීම.**

2026.07.15 – 2027.07.14 දින දක්වා වසරක කාල සීමාවක් සඳහා මෙම ආයතන පරිශ්‍රයේ නඩත්තු සේවාව ලබා ගැනීමට අදාලව මිල ගණන් කැඳවනු ලැබේ.

02. මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර ආයතන පරිශ්‍රය පරීක්ෂා කිරීම සියළු ලංසුකරුවන් වෙතින් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ලංසුකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම 2026.06.30 දින පෙ.ව 10.00ට දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පැවැත්වෙන අතර, එදිනට ඔබගේ පැමිණීම කාරුණිකව අපෙක්ෂා කරමි. දු.අං. 057-2229015 අමතා මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) මගින් වැඩි විස්තර ලබා ගත හැකිය.

03. ඒ සඳහා වන උපදෙස් ඇමුණුම 01න් දැක්වෙන අතර, ඔබ ආයතනයේ මිල ගණන් මේ සමඟ සපයා ඇති ආකෘති පත්‍රයෙහි සඳහන් කර ඇති පරිදි සියලු විස්තර සහිතව නිවැරදිව සම්පූර්ණ කර, **අත්සන සහ නිල මුද්‍රාව** සමඟ මා වෙත ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි. අසම්පූර්ණ මිල සැපයීම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන මිල ගණන් මාස 03 ක කාලයක් සඳහා වලංගු විය යුතු ය. මිල ගණන් භාර ගැනීම 2026.07.06 වන දින ප.ව.02.00න් අවසන් වේ.

04. ඔබ විසින් සපයනු ලබන මිල ගණන් මුද්‍රා තැබූ ලිපි කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ **"මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට නඩත්තු සේවා සැපයීම 26/27"** ලෙස අනිවාර්යයෙන් සඳහන් කර 2026.07.06 වන දින ප.ව.02.00 ට පෙර **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ හෝ අතින් රැගෙන විත් ආයතනයේ ඇති අදාල ප්‍රසම්පාදන ලිපි පෙට්ටියට බහාලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. ගෙවීම් කටයුතු සිදු කිරීමේ දී අදාල මුද්දර බදු සහ අනෙකුත් බදු සඳහා ඔබ යටත් විය යුතු අතර, මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී මේ සමඟ අමුණා ඇති **දූෂසන්ධානීය නොවන** බවට ප්‍රකාශය ද අත්සන් තබා ඉදිරිපත් කළ යුතු ය. 2026.07.06 වන දින ප.ව.02.05 ට මිල ගණන් විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය
මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය
දියතලාව.

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය

**<u>දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතන පරිශ්‍රයේ</u>**
**<u>නඩත්තු සේවා සැපයීම (තණකොළ කැපීම) සඳහා ලංසුකරුවන්ට ලබා දෙන උපදෙස්</u>**

කොන්ත්‍රාත්කරු විසින් 2026.07.15 සිට 2027.07.14 වැනි දින දක්වා වූ වසරක කාල පරිච්ඡේදය තුල මීට අදාළ ලංසු පත්‍රයේ දක්වා ඇති ගිවිසුමේ කොන්දේසීන්ට යටත්ව, මෙහි පහතින් දක්වා ඇති සේවා හා කොන්දේසීන්ට අනුව, දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතන පරිශ්‍රයේ නඩත්තු සේවාව (තණකොළ කැපීම) සිදු කරගෙන යෑම සඳහා මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසු පත් කැඳවනු ලැබේ.

01. **<u>ලංසු පත්‍රය සම්පූර්ණ කිරීමට අදාළ උපදෙස්.</u>**

මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට අයත් භූමිය ප්‍රධාන කලාප 11 කට බෙදා ඇත. මෙම කලාප 11 සඳහා වෙන වෙනම මිල ගණන් ලබා ගැනීමට යෝජිත බැවින් මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර ආයතන පරිශ්‍රය පරික්ෂා කිරීම සියළු ලංසුකරුවන් වෙතින් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ලංසුකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම 2026.06.30 දින පෙ.ව 10.00 ට දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පැවැත්වෙන අතර, එදිනට ඔබගේ පැමිණීම කාරුණිකව අපෙක්ෂා කරමි. දු.අං. 057-2229015 අමතා මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) මඟින් වැඩි විස්තර ලබා ගත හැකිය.

i. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් ලබාදෙනු ලබන වැඩසටහන අනුව මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) ගේ උපදෙස් මත තණකොළ කැපීමේ කටයුතු සිදු කල යුතුය.

ii. ඔබ විසින් සපයනු ලබන මිල ගණන් මුද්‍රා තබන ලද ලිපි කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ **<u>"මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට නඩත්තු සේවා සැපයීම 26/27"</u>** ලෙස සඳහන් කළ යුතුය.

iii. එකී සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු පත්‍ර **2026.07.06 දින ප.ව 2.00 ප්‍රථම ලැබෙන සේ** <u>"**සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය,** මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතන, දියතලාව"</u> යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් රැගෙන විත් ආයතනයේ ඇති අදාල ප්‍රසම්පාදන ලිපි පෙට්ටියට බහාලිය යුතු ය. (ලංසුකරුගේ නම හා ලිපිනය ඉහත කවරයේ සඳහන් කළ යුතුය.)

iv. ලංසු පත්‍ර පරීක්ෂා කිරීමේ දී එහි යම් ගණිතමය වරදක් පිළිබඳව අනාවරණය වුවහොත් ඒකක මිල පදනම් කරගෙන මුළු මුදල ගණනය කරනු ලැබේ.

v. සියලුම වෙනස් කිරීම් තනි ඉරකින් කපා කෙටි අත්සන් යොදා සහතික කළ යුතු අතර, එසේ නොවුනහොත් ලංසු පත්‍රය විධිමත් නොවන ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. ලංසු පත්‍රයේ අංක 02, 06, 07, 13 මගින් ඉල්ලා ඇති ලියකියවිලි නොඅඩුව හා සම්පූර්ණව ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

vii. එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැකි වනුයේ එක් ලංසු පත්‍රයක් පමණි. කුමන හෝ ආකාරයකින් ලංසු පත්‍ර එකකට වැඩි ප්‍රමාණයක් යොමු කර ඇති බව අනාවරණය වුවහොත් එකී සියළුම ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

viii. ඉදිරිපත් කරනු ලබන ලංසු පත්‍රයක් හෝ සියළුම ලංසු පත්‍ර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම (සාධාරණ හෝ නීත්‍යානුකූල හේතූන් මත) ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, ප්‍රතික්ෂේප කරනු ලබන ලංසුපත්‍ර වෙනුවෙන් නැවත ගෙවනු ලබන ලංසු බැඳුම්කරය හැර වෙනත් කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

02. **<u>සපුරාලිය යුතු මූලික සුදුසුකම්</u>**

i. සේවා සපයන ආයතනය, ව්‍යාපාරයක්/ සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුල ලියාපදිංචි කර තිබිය යුතුයි.

ii. ලංසු කැඳවන වර්ෂයට අදාළව ඉහත i. හි සඳහන් ලියාපදිංචිය වලංගුව තිබිය යුතු අතර, අසාදු ලේඛණගත නොවූ ආයතනයක් විය යුතුය.

iii. මෙම සේවාවට අවශ්‍ය සියලුම උපකරණ හා කොන්ත්‍රාත්කරු විසින් සපයා ගත යුතුය. ඒවා ගබඩා කර ගැනීම සඳහා <u>අවශ්‍යනම්</u> කාමරයක් සපයනු ලැබේ. එම උපකරණ සේවා කිරීම, අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව ද කොන්ත්‍රාත්කරු විසින් ම සිදු කරගත යුතු වේ. යන්ත්‍ර සූත්‍ර සඳහා අවශ්‍ය ඉන්ධන තමා විසින්ම සපයා ගත යුතුය.

03. **ලංසු භාර ගැනීම /විවෘත කිරීම.**

i. ලංසුපත්‍ර භාර ගැනීම **2026.07.06** දින ප.ව 02.00 ට අවසන් කරන අතර, ලංසු පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමේ කමිටුව ඉදිරි පිට ලංසු පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ එකී ආයතනය /ලංසුකරු විසින් ලිඛිතව බලය පැවරූ එක් නියෝජිතයෙකුට පමණක් සහභාගී විය හැකිය.

04. **කොන්ත්‍රාත් කාල සීමාව.**

i. 2026.07.15 සිට 2027.07.14 වැනි දින දක්වා වසරක කාල සීමාවක් සඳහා පමණි.

05. **ලංසු බැඳුම්කරය**

I. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් කොන්දේසි රහිතව ඉල්ලූ විගස ගෙවීම් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) නමට ලියන ලද 2026.07.06 දින සිට වසරක කාලයකට වලංගු රු. 50,000.00 (රුපියල් පනස්දහසක) ඇපකරයක් හෝ එම වටිනාකමට අදාළ මුදල මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ ගිණුම් අංශයේ තැන්පත් කර ලබා ගත් පොදු 172 කුවිතාන්සියේ පිටපතක්, ලංසු බැඳුම්කරය ලෙස ඉදිරිපත් කළ යුතුය. (පොදු 172 කුවිතාන්සියේ පිටපතක් ලංසු ඉදිරිපත් කිරීමේදී ඒ සමඟ අමුණා තිබිය යුතුය.) පොදු 172 කුවිතාන්සියේ මුල් පිටපත තමා සන්තකයේ තබා ගත යුතුය.

II. සාර්ථක ලංසුකරු තෝරා ගැනීමෙන් පසුව ලංසු ඇපකරය නිදහස් කරනු ලැබේ.

III. තෝරා ගන්නා ලද සාර්ථක ලංසුකරු එය භාර ගැනීම / ඉටුකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඔහුගේ ඉහත ඇපකරය මුදල් කර රාජසන්තක කරනු ලැබේ.

IV. ලංසු ඇපකරය සඳහා පොලිය ගෙවනු නොලැබේ.

06. **ලංසු ඇගයීම හා ප්‍රසම්පාදන කටයුතු**

i. විවෘත කරන ලද ලංසු පත්‍ර ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ලංසු ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන අතර, එමගින් ලංසුකරුවන්ගේ සුදුසුකම් විශ්ලේෂණය කර නිර්දේශ සමග ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලබයි. පසුව ප්‍රසම්පාදන කමිටුව විසින් සියළුම කරුණු හා නිර්දේශ විශ්ලේෂණය කර සාර්ථක ලංසු කරු තෝරාගනු ලබයි.

ii. **ලංසු ඇගයීම් කමිටුව විසින් ඇගයීම සඳහා යොදාගනු ලබන නිර්ණායක.**

1. කොන්ත්‍රාත්කරු සතුව ඇති මානව සම්පත හා එක් ආයතනයක් වෙනුවෙන් සේවයේ යෙදවිය හැකි උපරිම සේවක සංඛ්‍යාව
2. ලංසුකරු සතු උපකරණ ප්‍රමාණය (භාවිතාකළ හැකි ප්‍රමාණය)
3. මීට පෙර මෙවැනි සේවාවන් සැපයීමෙන් ලබා ඇති අත්දැකීම්
4. මීට පෙර මෙම සේවාව සපයනු ලැබූ සම මට්ටමේ ආයතන වලින් ලබා දී ඇති සේවා සහතික/නිර්දේශ
5. මෙම ආයතනයට සම මට්ටමේ ආයතනවල දැනට පවත්වාගෙන යනු ලබන වෙනත් කොන්ත්‍රාත් පිළිබඳ විස්තර
6. ඉදිරිපත්කර ඇති කොන්ත්‍රාත් මුදල

(මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී ඉහත සඳහන් සාධක සහ ආයතනයන් විසින් අංක 02 හි සඳහන් සපුරාලිය යුතු මූලික සුදුසුකම් සලකා බලමින් ලැබී ඇති ලංසු, ඇගයීම් කර සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති සාර්ථක ලංසුකරු තෝරා ගනු ලැබේ)

07. **අභියාචනා ඉදිරිපත් කිරීම**

සාර්ථක ලංසුකරු තෝරාගත් පසු ඒ බව සාර්ථක ලංසුකරුට දන්වා යවන අතර, අනෙකුත් ලංසු කරුවන්ටද ඔවුන්ගේ ලංසු තෝරා නොගත් බව දන්වා යවනු ලැබේ. මේ සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් ඇත්නම් සෙසු ලංසුකරුවන් එම දැන්වීම නිකුත් කළ දින සිට සතියක් ඉක්මවා නොයන දිනයක් තුළදී තම අභියාචනා ඉදිරිපත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මණ්ඩලය විසින් කරුණු විමර්ශනය කර සතියක් ඇතුලත දී තම තීරණය දැනුම් දෙනු ලැබේ.

08. **ලංසු පිරිනැමීම**

i. තෝරාගන්නා ලද සාර්ථක ලංසුකරු වෙත ඔහු තෝරාගත් බව ලිඛිතව, ඔහු විසින් ලංසු පත්‍රයේ සඳහන් කර ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබේ.

ii. සාර්ථක ලංසුකරු වෙත යොමු කරන පිළිගැන්වීමේ ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුලත ඒ සඳහා ප්‍රතිචාර දැක්විය යුතු අතර, එසේ නොකරන්නේ නම් ලංසුකරු මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවා සේ සලකා එම ලංසුව අවලංගු කර, ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය යටතේ ඊලඟ සුදුසුකම් සපුරා ඇති ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිළිගන්වන අතර, ඉහත 05 (**iii**) පරිදි කටයුතු කරනු ලැබේ.

09. **කාර්යය සාධන බැඳුම්කරය**

i. තෝරාගත් සාර්ථක ලංසුකරු වෙත ඒ බව දැන්වීමෙන් පසුව, බදු රහිත සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක මුදලක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් කොන්දේසි රහිතව ඉල්ලූ විගස ගෙවීම් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) නමට ලියන ලද ගිවිසුම් ගත දින සිට දින **396** ක් වලංගු ඇපකරයක් හෝ එම වටිනාකමට අදාල මුදල මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ ගිණුම් අංශයේ තැන්පත් කර ලබා ගත් පොදු 172 කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.(පොදු 172 කුවිතාන්සියේ මුල් පිටපත තමා සන්තකයේ තබා ගත යුතුය)

10. **ගිවිසුම අත්සන් කිරීම**

i. සාර්ථක ලංසුකරු තෝරාගත් පසු පිළිගැන්වීමේ ලිපියේ සඳහන් අවසන් දිනට ප්‍රථම කාර්යය සාධන බැඳුම්කරය සමග පැමිණ ගිවිසුම අත්සන් කළ යුතුය. (අංක 8 (**ii**) අදාළවේ)

11. **ඉටු කළ යුතු කාර්යයන්**

I. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් ලබාදෙනු ලබන වැඩසටහන අනුව මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) ගේ උපදෙස් මත තණකොළ කැපීමේ කටයුතු සිදු කළ යුතුය.

II. අදාල කලාපයේ තණකොළ කපා අතුගා පිරිසිදු කර, කැපූ තණකොළ ඒ සඳහා නම් කර ඇති ස්ථානවලට බැහැර කිරීම.

III. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) ගේ අනුමැතිය හෝ අවසරයක් නොමැතිව ආයතනය විසින් ලබා දෙන ලද වැඩසටහන කොන්ත්‍රාත්කරු විසින් වෙනස් කල නොහැකිය.

12. **සේවා කොන්දේසි**

I. තණකොළ කැපීම සඳහා මෙම ආයතන පරිශ්‍රයට පැමිණෙන සේවකයන් විසින් සම්පත් කලමනාකරණ අංශයේ තබා ඇති පැමිණීමේ ලේඛනයේ පැමිණීම - පිටවීම සටහන්කළ යුතුය.

II. තණකොල කැපීමේ සේවයේ කිසිදු සේවකයෙකු/ නිලධාරියෙකු මෙම ආයතනයේ කිසිදු සේවකයෙකු හෝ නිලධාරියෙකු සමඟ පෞද්ගලික සම්බන්ධතා නොපැවැත්විය යුතු අතර, මෙම ආයතනයේ සේවකයෙකුගේ පවුලේ ඥාතිවරයෙකු, සේවය සඳහා නොයෙදවිය යුතුය.

III. තණකොල කැපීමේ සේවාව සැපයීම සඳහා ආයතනය වෙත අනුයුක්ත කරනු ලබන සේවකයන් සම්බන්ධ තොරතුරු ආයතනය වෙත ලබාදිය යුතුය.

IV. මෙම ආයතනය මගින් අදාල උපකරණ හෝ ඉන්ධන සපයනු නොලැබේ.

V. වෙන් කර ඇති එක් කලාපයක උපරිම දින 03ක් ඇතුලත තණකොළ කපා අවසන් කළ යුතුය.

VI. මෙහි සේවයේ යොදවනු ලබන සියළුම කාර්යය මණ්ඩලය කාර්යාල භූමිය තුල ආචාරශීලීව හා විනය ගරුකව හැසිරිය යුතුවේ. එමෙන්ම කාර්ය මණ්ඩල සේවකයන් අතර හෝ තුන්වන පාර්ශවයක් සමග යම් ගැටුමක් ඇතිවුවහොත් ඒ සම්බන්ධයෙන් මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය කිසිදු වගකීමක් දරනු නොලබන අතර, තණකොල කැපීමේ සේවකයින් / නිලධාරීන්, ආයතනයේ සේවකයෙක් හෝ නිලධාරියෙක් සමග ගැටුමක් ඇති කර ගනු ලැබුවහොත් හෝ බීමතින් හැසිරුනහොත් රජයේ නීති රෙගුලාසීන් යටතේ කටයුතු කරනු ලැබේ.

VII. රජයේ නිවාඩු දින, රජය විසින් නම් කරන විශේෂ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි තණකොල කැපීම සිදු කිරීමට පැමිණීමට පෙර ඒ සඳහා මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමණාකරන)ගෙන් අවසර ලබාගත යුතුය.

VIII. මෙම කොන්ත්‍රාත්තුව සඳහා අත්තිකාරම් මුදල් ලබා දෙනු නොලැබේ.

IX. කාර්යාල පරිශ්‍රය තුළ යම් සොරකමක් හෝ අවිධිමත් කටයුත්තක් සිදුවී ඇති බවට වාර්තා වුවහොත් ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) විසින් නම් කරනු ලබන කමිටුවක් විසින් පරීක්ෂණ පවත්වනු ලබන අතර, එහිදී එම විෂයගත කරුණ සම්බන්ධයෙන් වග කිවයුතු බවට ඔප්පු වුවහොත් ප්‍රමානණය කළ අලාභ ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී. එසේ වුවහොත් ඒ සම්බන්ධයෙන් නීති මාර්ගයෙන් ද කටයුතු කරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) විසින් තීරණය කරන ඕනෑම අවස්ථාවක මෙම ගිවිසුම අවලංගු කිරීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) හට බලය ඇත.

X. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) ගේ අනුමැතිය හෝ අවසරය, කලින් ලිපියකින් ලබා නොගෙන, මෙම කොන්ත්‍රාත්තුව යටතේ තමාට පැවරී ඇති අයිතිවාසිකම් සහ යුතුකම් වෙනත් කෙනෙකුට/ආයතනයකට පැවරීම හෝ වෙනත් අන්දමකට අන්සතු කිරීමට හෝ අතුරු කොන්ත්‍රාත්තුවක් වශයෙන් ලබා දීම හෝ තමා වෙනුවෙන් එකී කොන්ත්‍රාත්තුව කරගෙන යෑමට වෙනත් කිසියම් පුද්ගලයෙකුට ඇටෝර්නි බලය පැවරීම හෝ කොන්ත්‍රාත්කරු විසින් නොකළ යුතුය.

XI. මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට අවශ්‍ය වන්නේ නම් පිළිගත හැකි කරුණු සහිතව ලිත් මාස 03 කට කලින් දැනුම් දිය යුතු වේ. එසේ නොකරන්නේ නම් කාර්යසාධන බැඳුම්කරය රාජසන්තක කරනු ලබන අතර ආයතනය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ හා මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අසාදු ලේඛනයටද ඇතුළත් කරනු ලැබේ.

XII. ගිවිස ගනු ලබන කාලය තුල කිසියම් දිනක දී මෙම කොන්ත්‍රාත්තුවට අදාළ කටයුත්තක් නිසි පරිදි නිම කර දීමට කොන්ත්‍රාත්කරු අසමත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) විසින් හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියා විසින් කොන්ත්‍රාත්කරුට නැවත එම කාර්යය නිසි පරිදි ඉටු කර දීමට ලිඛිතව උපදෙස් ලබා දීමෙන් පසුවත්, කොන්ත්‍රාත්කරු විසින් එය ඉටු නොකරන්නේ නම් හෝ පවරා ඇති සේවා කටයුතු නිරන්තරයෙන්ම පැහැර හරින බව පෙනීයන්නේ නම් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට සහ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අසාදු ලේඛනයට ඇතුළත් කිරීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) හට බලය ඇත.

XIII. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව නඩත්තු සේවය සපයන කාර්ය මණ්ඩලයේ වැටුප් හා සියළුම දීමනා සම්බන්ධයෙන් හෝ ඔවුන් විසින් සිදුකරන්නා වූ යම් නීතිවිරෝධී ක්‍රියාවක් වෙනුවෙන් හෝ 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත හා ඒ පිළිබඳ කුමන හෝ ව්‍යවස්ථාපිත සංශෝධන වෙනස් කිරීම් හෝ දීර්ඝ කිරීම් යටතේ කොන්ත්‍රාත්කරුගේ කවර හෝ සේවකයෙකු සම්බන්ධයෙන් කරනු ලබන හිමිකම් පෑමක් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) වගකියනු නොලැබේ.

XIV. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) ගේ හා කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත කාලානුරූපීව සිදුවන අවශ්‍යතාවන්ට අනුව මෙම කොන්දේසි වෙනස් කිරීමට හැකිය.

13. **<u>ගෙවීම් කටයුතු</u>**

i. වෙන්කර ඇති කලාපවල තණකොළ කැපීමේ කටයුතු නිසි පරිදි අවසන් වූ පසුව කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත මුදලට අනුව සම්පූර්ණ කරන ලද බිල්පතක් (Invoice) මිනින්දෝරු අධිකාරී (සම්පත් කළමනාකරණ) වෙත ඉදිරිපත් කළ යුතුවේ.

ii. යම්කිසි කලාපයක තණකොල කපා අවසන් වීමෙන් පසු මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමණාකරන) වෙත ඒ බව දන්වා ඔහු විසින් වැඩ අවසන් කල බවට ලබාදෙන සහතිකය වවුචරයට අමුණා එවිය යුතුය.

iii. ඉහත අංන 11 යටතේ පැවරෙන වගකීම් නිසි පරිදි කර ඇති බවට මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) විසින් පරීක්ෂා කර අනුමත කරනු ලැබේ. යම් මාසයකට අදාළ කිසියම් වූ කාර්යයක් තෘප්තිමත් ලෙස සිදු කර නොමැති නම්, එම කාර්යයන් නිසි පරිදි ඉටු කර අවසන් කරන තුරු ගෙවීම් කටයුතු ප්‍රමාද කරනු ලැබේ.

iv. මෙහි සඳහන් කොන්දේසිවලට අනුව, අදාළ සේවාවන් නිසි පරිදි ඉටු කිරීමෙන් පසු අදාල ලියකියවිලි කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කල දින සිට දින තිහක් (30) ඇතුළත දී බිල්පත සඳහා ගෙවිය යුතු මුදල් චෙක්පතක් පියවනු ලබයි.

v. නඩත්තු සේවකයින් සඳහා ඔවුන්ගේ ඇඳුම් පැලඳුම්/ආහාර සහ අනෙකුත් අත්‍යාවශ්‍ය භාණ්ඩ තබා ගැනීමට සහ රෙදිපිළි මාරු කර ගැනීම සඳහා <u>අවශ්‍යනම්</u> කාමරයක් සපයන අතර එයට අදාළ මාසික කුලිය ලෙසට (ජල/විදුලිය ඇතුලුව) රු. 5,000.00 ක මුදලක් ආයතනයට ගෙවිය යුතුය.

14. **<u>ගිවිසුම අවසන් කිරීම</u>**

**i.** ගිවිසුම් කාලය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) විසින් දීර්ඝ නොකරන අවස්ථාවක ගිවිසුමේ සඳහන් පරිදි ගිවිසුම් ගත කාලය අවසන් වන දිනයෙන් පසු මෙම කොන්ත්‍රාත්තුව අවසන් වනු ඇත.

**ii.** ඉහත අංක 11 මගින් සඳහන් කර ඇති ඉටු කල යුතු කාර්යයන් නිසි පරිදි සම්පූර්ණ නොකරන බවට හා ගිවිසුමගත කොන්දේසීන් කඩකරන අවස්ථාවන් වලදී ඒ බව හඳුනාගැනීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) විසින් ලිත් මාසයකට පෙර දැනුම් දී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ හැකියාව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) සතුව ඇත.

**iii.** මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට අවශ්‍ය වන්නේ නම් 12 (xi)පරිදි කටයුතු කළ යුතුය.

15. **<u>නීති</u>**

**i.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති රීති මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් බල පැවැත්වේ.

**දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ නඩත්තු සේවාවට අදාළ ලංසුව ඉදිරිපත් කිරීමට පෙර මෙහි ඉහත දක්වා ඇති අංක 01 සිට අංක 15 දක්වා වූ කරුණු සියල්ල හොඳින් කියවා අවබෝධයකින් යුතුව ලංසු පත්‍රය ඉදිරිපත් කළ යුතුය. අදාළ කුමන හෝ ලේඛනයක කිසියම් කොටසක අර්ථය සම්බන්ධයෙන් ලංසුකරු හට කිසියම් නොපැහැදිලිතාවයක් වෙතොත් ලංසු ඉදිරිපත් කිරීමට පෙර** මිනින්දෝරු අධිකාරි (සම්පත් කළමනාකරණ) **මඟින් එය පැහැදිලි කර ගත යුතුය. (දුර. අං: 057-2229015)**

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව.
## දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පරිශ්‍රයේ
## නඩත්තු සේවා සැපයීම (තණකොළ කැපීම) සඳහා මිල ගණන් කැඳවීම.

## <u>ලංසු පත්‍රය</u>

මෙම ලංසු පත්‍රයට අදාළ කොන්දේසි කියවනු ලැබීමෙන් පසුව එහි සඳහන් සියළුම කොන්දේසීන්ට යටත්ව දියතලාව පිහිටි මැනුම් හා සිතියම් ගත කිරීමේ **ආයතන පරිශ්‍රයේ නඩත්තු** සේවාව සැපයීම (තණකොළ කැපීම) සඳහා මිල ගණන් කැඳවීමට අදාළ ලංසුව පිළිබඳව විස්තරය මෙ සමඟ ඉදිරිපත් කරමි.

**01 ආයතනයේ/ ව්‍යාපාරයේ ලියාපදිංචි නම** -.......................................................................................

**02 ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කළ අංකය හා දිනය** - ......................................................................

(ඇමුණුම අංක .........)

**03 ලිපිනය**- ............................................................................................................................

...........................................................................................................................................................

**04**

i. ස්ථාවර දූරකථන අංකය -.........................................

ii. දුරලියන (Fax) අංකය -.........................................

iii. ආයතන ප්‍රධානයාගේ ජංගම දූරකථන අංකය -.........................................

iv.ආයතනයේ විද්‍යුත් තැපැල (E-mail)- .........................................................

**05. ශාඛා කාර්යාල තිබේ නම් ඒවායේ ලිපිනයන් හා දූරකථන අංක -**

| අනු අංකය | ශාඛාව පිහිටා ඇති ස්ථානය | දූරකථන අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**06.**

i. එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංකය-........................................................

(සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

ii. සේවක අර්ථසාධක අරමුදල් (E.P.F.) ලියාපදිංචි අංකය-..............................................

iii.සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් (E.T.F.) ලියාපදිංචි අංකය-.................................

**07. ආයතනයේ වාර්ෂික පිරිවැටුම**. (වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මගින් සනාථ කළ යුතුය. ඇමුණුම ............)

| අනු අංකය | වර්ෂය | වාර්ෂික පිරිවැටුම රු. |
|---|---|---|
| 1 | 2023 | |
| 2 | 2024 | |
| 3 | 2025 | |

08. නඩත්තු කටයුතු වලට අදාළව ආයතනය සතු මානව සම්පත් තොරතුරු (2026 වර්ෂයේ) -

| තනතුරු | සේවක ප්‍රමාණය | | වයස අවු 18- 50 අතර, සේවක සංඛ්‍යාව. | සේවක අර්ථසාධක අරමුදලට දායක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ස්ථිර | අනියම් | | |
| | | | | |
| | | | | |
| | | | | |

ii. වර්තමාන අධ්‍යක්ෂකවරුන්, කොටස්කරුවන්ගේ නම් සහ ලිපිනයන්-

| අනු අංකය | නම | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

09. ආයතනය සතු තණකොළ කපන යන්ත්‍ර ප්‍රමාණය- ................

10. වර්තමානයේ මෙවැනි නඩත්තු සේවා සැපයීමේ නිරත වී ඇති කොන්ත්‍රාත්තු පිළිබඳ විස්තර. (2026 වර්ෂයේ)

| ආයතනයේ නම සහ ලිපිනය | කොන්ත්‍රාත්තු කාලය | | කොන්ත්‍රාත්තුව යටතේ යොදවන ලද සේවක සංඛ්‍යාව | එම කොන්ත්‍රාත්තුවේ මාසික පිරිවැටුම රු. |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |

11.පසුගිය වර්ෂවල සිදු කරන ලද කොන්ත්‍රාත්තු පිළිබඳ විස්තර

| ආයතනයේ නම සහ ලිපිනය | කොන්ත්‍රාත්තු කාලය | | කොන්ත්‍රාත්තුව යටතේ යොදවන ලද සේවක සංඛ්‍යාව | එම කොන්ත්‍රාත්තුවේ මාසික පිරිවැටුම රු. |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ නඩත්තු සේවාව (තණකොළ කැපීම) පවත්වා ගෙන යෑම සඳහා අපගේ මිල ගණන් පහත පරිදි ඉදිරිපත් කරමි.

| කලාප අංකය | එක්වරක් තණකොළ කපා අවසන් කිරීමට යන මුදල (රු) | වැට් අගය (රු) | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| කලාප අංක 01 | | | |
| කලාප අංක 02 | | | |
| කලාප අංක 03 | | | |
| කලාප අංක 04 | | | |
| කලාප අංක 05 | | | |
| කලාප අංක 06 | | | |
| කලාප අංක 07 | | | |
| කලාප අංක 08 | | | |
| කලාප අංක 09 | | | |
| කලාප අංක 10 | | | |
| කලාප අංක 11 | | | |

13. ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල වන රු. 50,000/- ක මුදල ගෙවූ කුවිතාන්සි අංකය ............................ හා දිනය .......................... (ඡායා පිටපතක් අමුණන්න).

14. යම් සේවා සැපයුම් ආයතනයක් විසින් මීට පෙර ඔබ/ඔබ ආයතනයේ සේවා සැපයීම අත්හිටුවා තිබේද?

ඔව්/ නැත

15. එසේ අත්හිටුවා ඇත්නම් ඊට පාදක වූ හේතුව -......................................................................

..........................................................................................................................

..........................................................................................................................

16. ආදායම් බදු හෝ රජයට ගෙවිය යුතු යම් බදු මුදලක් පැහැර හැරීම සම්බන්ධයෙන් ඔබ/ ඔබ ආයතනය අධිකරණයකදී වරදකරු වී තිබේද ? ඔව්/නැත

17. වෙනත්කරුණු......................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

18. මේ සමග ලබා දී ඇති ගිවිසුමේ කොන්දේසීන්ට - එකඟ වෙමි / එකග නොවෙමි.

මා විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රකාශ හා තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් ප්‍රකාශ කරමි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ පවත්නා නීති රීතිවලට හා කලින් කලට හඳුන්වා දෙනු ලබන බදු හා නීති රීති වලට එකඟව හා කම්කරු නීති හා දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ පවත්නා හා කාලානුරූපීව වෙනස් වන නීති රීති, ලංසු කොන්දේසි වලට එකඟ වන බවද ප්‍රකාශ කර සිටිමි.

දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු) හා මාගේ ආයතනයේ එකඟතාවය අනුව කාලානුරූපීව සිදුවන අවශ්‍යතා මත මෙම කොන්දේසි වෙනස් කිරීමටද එකඟතාවය ප්‍රකාශ කරමි.

මෙහි ඉහත සඳහන් යම් ප්‍රකාශයක් හා තොරතුරක් සාවද්‍ය බව අනාවරණය වුවහොත් හෝ මගේ/ආයතනයේ සේවා සැපයුමේ අසාර්ථකභාවය හෝ ලංසු කොන්දේසි හෝ වෙනත් නීති රීති උල්ලංඝණය කිරීම යන ඕනෑම කාරණයක් හේතුකොට ගෙන හෝ මාගේ/ආයතනයේ සේවා සැපයුම අවලංගු කිරීමට හෝ වෙනත් පවත්නා නීති ප්‍රතිපාදනයන් යටතේ දඩුවමකට යටත්වීමට එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය......................

ලංසුකරුගේ අත්සන ..............................................

නම ..............................................................

..............................................................

ජා.හැ. අංකය - ..............................................

නිල මුද්‍රාව.......................................................

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩල
මැනුම් හා සිතියම් ගත කිරීමේ ආ
දියතලාව.

<u>මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව</u>

<u>**දූෂ්‍යසන්ධානීය නොවන බවට ප්‍රකාශය**</u>

**(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා යොමුව - 1.5)**

පහතින් අත්සන් කරනු ලබන ලංසුකරු/ ලංසුකරු නියෝජනය කරනු ලබන්නා/ ලංසුකරුගේ නියෝජිතයා වන මා, අවංකව ද, සත්‍යවාදීව ද, ගාම්භීරතා පූර්වකව ද ප්‍රකාශ කර සිටින්නේ;

(අ) අදාල ලංසු කැඳවීමේ දී, කවරෙකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සම්බන්ධයෙන් මා විසින් හෝ මා නියෝජනය කරනු ලබන ආයතනයේ/ සමාගමේ/ සංස්ථාවේ/ හවුල්කාරීත්වයේ අන් කවර හෝ සාමාජිකයෙකු, නියෝජිතයෙකු හෝ නියෝජනයකරන්නෙකු විසින් වෙනත් කවර හෝ තැනැත්තෙකු සමඟ කිසිදු සංයෝජනයකට, දූෂ්‍යසන්ධානයකට හෝ එවැනි ගිවිසුමකට ඇතුළත්ව නොමැති බවත්;

(ආ) මා විසින් හෝ මා නියෝජනය කරන අන් කවරෙකු විසින් හෝ, (ලංසු අංක :..............................) ට අදාලව ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, කවරෙකු හෝ ලංසු ඉදිරිපත් කිරීමෙන් වළක්වාලීම හෝ ලංසු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීම සඳහා පොළඹවාලීමට ක්‍රියාකර නොමැති බවත්;

(ඇ) මෙම ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ, අන් කවර හෝ ලංසුවකට අදාලව දූෂ්‍යසන්ධානීය නොවෙමින් බවත්, එවැනි ලංසුවක් සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙක් සමඟ වන කවර හෝ ගිවිසුමකින්, අවබෝධයකින් හෝ සංයෝගයකින් හෝ නොවන බවත් ය.

මෙම ලංසුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුගෙන්, සමාගමකින් හෝ සංස්ථාවකින්, සෘජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වටිනා දෙයක් ලබා ගෙන නොමැති බවත් නැතහොත් ලබා නොගන්නා බවත් මම ප්‍රකාශ කර සිටිමි.

මා විසින් තවදුරටත් ප්‍රකාශකර සිටින්නේ, මෙම ලංසුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුට, සමාගමකට හෝ සංස්ථාවකට, සෘජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, ත්‍යාගයක්, කොමිස් මුදලක් හෝ වටිනා දෙයක් මා විසින් ලබා දී නොමැති බවත්, නැතහොත් ලබා නොදෙනු ඇති බවත් ය.

දූෂ්‍යසන්ධානීය නොවන බව සහතික කිරීමේ පූර්ණ වගකීම භාරගන්නා මා විසින්, සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සාධාරණ හා සදාචාරාත්මක තරඟකාරී පරිචයන්ට අනුගතව ක්‍රියාකරන බවටත්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියාකරන බවටත් පොරොන්දු වෙමි.

ඉහතින් මා විසින් කරන ලද සියලුම ප්‍රකාශයන් සත්‍ය සහ නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කර සිටී.

..................................................

ප්‍රකාශකගේ අත්සන